**හොරණ ප්‍රාදේශීය සභාව**

**------------------------------**

**කළුතර දිස්ත්‍රික්කය**

**-------------**

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 13 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 18 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට හොරණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------ | ---------------------- |
| තොග වටිනාකම ලෙස භෞතික තොගය ගිණුම්ගත කිරීම වෙනුවට රු.5,896,590 ක් වූ පොත් අගය ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | 2019 දෙසැම්බර් 31 දින සිට භාණ්ඩ සමීක්ෂණය සිදු කල දින දක්වා භාණ්ඩ සමීක්ෂණයෙන් ලබාගත් භෞතික තොග ප්‍රමාණයත් ගබඩා පොත් වල තොග ප්‍රමාණයත් සමාන බව දන්වමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.93,141,222 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන් ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු. 56,639,478 ක වෙනසක් විය. | අදාල ශේෂ වල වෙනස් කම් සසඳා ගිණුම් නිවැරදි කිරිමට කටයුතු කල යුතුය. | 2020 වර්ෂයේදි නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛන, තොග ලේඛන හා උපලේඛන නොමැති වීම නිසා එකතුව රු.150,473,604 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරිමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුය. | 2020 වර්ෂයේදි අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

1.4 අනුකූල නොවීම

1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ | | | | |
| | (i) 21වගන්තිය | 69,632,331 | ග්‍රාම සේවා වසම් අනුව සභාවට අයත් සමස්ථ මාර්ග ප්‍රමාණය හා ස්වභාවය හඳුනාගෙන ලේඛනගත කර නොතිබුණි. | පනත අනුව කටයුතු කල යුතුය. | පනත අනුව කටයුතු සිදුකරමින් පවතින බව දන්වමි. |
| | (ii) 38 වගන්තිය | | මංමාවත් නඩත්තු කිරීම සඳහා නඩත්තු සැලැස්මක් සකස් කර ඒවාට අදාල ප්‍රතිපාදන වාර්ෂික අයවැයට අන්තර්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | පනත අනුව කටයුතු කල යුතුය | ඉදිරියේදී නිවැරදි කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (iii) 134(1) වගන්තිය | වරිපනම් බදු සඳහා නව හඳුනාගැනීමක් සිදු කර නොතිබුණි. | පනත අනුව කටයුතු කළ යුතුය | ඉදිරියේදී නිවැරදි කරන බව දන්වමි. |
| (iv) 160 වගන්තිය - | හිඟ වරිපනම් බදු අය කර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපළ තහනම් කිරීම් කර නොතිබුණි. | පනත අනුව කටයුතු කළ යුතුය | ඉදිරියේදී නිවැරදි කරන බව දන්වමි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | සභාව සතු ඉඩම් පිලිබඳව සමීක්ෂණයක් කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා රීති අනුව කටයුතු කළ යුතුය. | සමීක්ෂණ මණ්ඩලයක් පත් කර ඉදිරියේදී සභාව සතු ඉඩම් නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් නිවේදනය | ආයතන 05 ක කල් ඉකුත් වූ පරිසර බලපත්‍ර සඳහා නව පරිසර බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගැසට් පත්‍රයට අනුව කටයුතු කරමි. | පරිසර බලපත්‍ර ලබා නොගත් ආයතන වලට බලපත්‍ර ලබා ගන්නා ලෙස දන්වා ඇති බව දන්වමි. |

1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතු කල අගය බදු පනත යටතේ 2002 වර්ෂයේ සිට 2012 කාලපරිච්ඡේදය සඳහා දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කල යුතුය. රු.2,084,385 ක එකතු කළ අගය මත බදු ප්‍රේෂණය කර නොතිබුණි. | එකතු කලයුතු බදු අදායම් දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වේ. | විගණන නිරීක්ෂණය පිළිගෙන ඇති බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.12,933,277 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.28,069,033 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 23,993,708 | 18,297,519 | 22,944,788 | 3,716,209 | 16,486,494 | 11,769,297 | 15,885,487 | 2,842,981 |
| (ii) | කුලී | 3,522,000 | 2,518,430 | 3,665,016 | 226,530 | 4,263,000 | 2,388,532 | 1,747,744 | 201700 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,549,900 | 1,953,538 | 2,912,101 | - | 1,613,500 | 1,219,626 | 1,656,638 | - |
| (iv) | වෙනත් ආදායම් | 107,793,506 | 94,211,000 | 78,471,697 | - | 85,531,100 | 65,000,000 | 107,531,597 | 40,603,906 |
| | | 136,859,114 | 116,980,487 | 107,993,602 | 3,942,739 | 107,894,094 | 80,377,455 | 126,821,466 | 43,648,587 |

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉදිරිපත් කර ඇති වරිපනම් බදු කාල විශ්ලේෂණය අනුව වසර 05 ට වැඩි හිඟ වරිපනම් ඒකක 111 කින් රු.264,968 ක් ද , වසර 10 ට වැඩි හිඟ වරිපනම් ඒකක 93 කින් රු.204,425 ක් ද අයකර ගෙන නොතිබුණි. | හිඟ වරිපනම් බදු අයකර ගත යුතුය. | අදහස් දක්වා නොමැත. |

2.2.3 උසාවි දඩ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.15,000,000 ක් විය. | හිඟ උසාවි දඩ අයකර ගත යුතුය. | 2019 වර්ෂයට අදාලව ලැබිය යුතු උසාවි දඩ මුදල් සඳහා උපලේඛන සකස් කර යවා ඇති අතර අධි බිල් කිරීම් සඳහා ගැලපීම් මුදල් ලැබුණු පසුව සිදු කරන බව දන්වමි. |

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගි සේවා, සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය , පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) අතුරු ව්‍යවස්ථා | | |
| ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් ප්‍රධාන කාරණා 04 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුය. | ඉදිරියේදී පනවා නැති අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) ක්‍රියාකාරි සැලැස්ම | | |
| (i) 2019 වර්ෂයට සකස් කරන ලද ක්‍රියාකාරි සැලැස්ම තුල ක්‍රියාකාරකම් වල ප්‍රගතිය මැන බැලීමේ ක්‍රමවේදයක් නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මට අනුව සිදු කරනු ලබන ක්‍රියාකාරකම් වල ප්‍රගතිය මැන බැලීමේ ක්‍රමවේදයක් ඇති කල යුතුය. | 2020 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම තුල ක්‍රියාකාරකම් වල ප්‍රගතිය මැන බැලීමේ ක්‍රමවේද සකස් කරන බව දන්වමි. |
| (ii) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව ඉදිකිරීම් ව්‍යාපෘති 79 ක් ප්‍රමුඛතාවය අනුව හඳුනාගෙන තිබුණ ද , එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොකර ක්‍රියාකාරි සැලැස්මෙන් පරිබාහිර පිරිවැය රු.23,184,718 ක් වූ මාර්ග ව්‍යාපෘති 72 ක් ඉටුකර තිබුණි. | ක්‍රියාකාරි සැලැස්මට අනුකූලව ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතුය. | 2020 වර්ෂයේ සිට ක්‍රියාකාරි සැලැස්මට අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කරන බව දන්වමි. |
| (ඇ) තිරසර සංවර්ධන ඉලක්ක | | |
| දිළිඳුකම පිටු දැකීම සඳහා මාවක් ඔය අසල බහුවිධ සේවා වෙළඳ මධ්‍යස්ථානයක් ඉදිකිරීම ආරම්භ කර | තිරසාර සංවර්ධන අරමුණු ඉටු කිරීමට කටයුතු කල යුතුය. | මාවක් ඔය අසල බහුවිධ සේවා වෙළඳ මධ්‍යස්ථානය ඉදිකිරීමට කඩිනමින් කටයුතු |

| | | |
|---|---|---|
| තිබුණු අතර වෙනත් කිසිදු කාර්යයක් මේ සඳහා සිදු කර නොතිබුණි. | | කරන බව දන්වමි. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත | | |
| (i) තනතුරු 12 කට අදාළව පුරප්පාඩු 19 ක් විය. | පුරප්පාඩු වූ තනතුරු සම්පූර්ණ කරවා ගත යුතුය. | සංවර්ධන නිලධාරි , පුස්තකාලාධිපති තනතුරු සඳහා බඳවා ගැනීමට පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඇති බවත්, ආදායම් පරීක්ෂක බඳවා ගැනීම සම්බන්ධයෙන් උසාවියේ නඩුවක් විභාග වෙමින් පවතින බවත්, අනෙකුත් තනතුරු සඳහා බඳවා ගැනීම් අත්හිටුවා ඇති බවත් දන්වමි. |
| (ii) ප්‍රාථමික මට්ටමේ තනතුරු 05 ක් වෙනුවෙන් සේවකයින් 28 දෙනෙකු අනුමැතියකින් තොරව ආදේශක පදනමින් බඳවාගෙන සමාලෝචිත වර්ෂයේදී රු.6,347,759 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි. | ආදේශක පදනමින් බඳවා ගැනිමේදී අදාල අනුමැතිය ගත යුතුය. | දැනට සිටින සේවකයින් ප්‍රමාණවත් නොවන බැවින් බඳවා ගැනීම් සිදු කර ඇති බව දන්වමි. |
| (iii) සභාවේ සේවය කරනු ලබන කණිෂ්ඨ සේවකයින් 45 දෙනෙකුගේ වැටුප් වර්ධක වසර 05 ක් තිස්සේ ලබාදීමට කටයුතු කර නොතිබුණු අතර සේවකයින් 07 දෙනෙකුගේ වැටුප් වර්ධක වසර 04 ක් තිස්සේ ලබා දීමට කටයුතු කර නොතිබුණි. | සභාවට අනුයුක්ත සේවකයින් හට නියමිත දිනයන්හි වැටුප් වර්ධක ලබාදිය යුතුය. | සියළුම සේවකයින්ගේ වැටුප් වර්ධක 2020 වසර අවසන් වීමට ප්‍රථම ලබාදීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) සේවක ණය | | |
| සේවය හැර ගිය හා මියගිය නිලධාරින් 06 දෙනෙකුගෙන් 2014 වර්ෂයේ සිට අය වීමට තිබු ණය ශේෂය රු.18,700 ක් විය. | හිඟ ණය ශේෂ අයකර ගත යුතුය. | හිඟ ණය ශේෂ අයකර ගැනිමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |

3.4 වත්කම් කළමණාකරණය

නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආයතනය සතු ඩුප්ලෝ මැෂිම දීර්ඝ කාලයක සිට අක්‍රීය තත්ත්වයේ පවති. | අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ වෙන්දේසි කිරිමට කටයුතු කළ යුතුය. . | ඩුප්ලෝ යන්ත්‍රය අළුත්වැඩියා කිරිමට හෝ වෙන්දේසි කිරිමට කටයුතු කරන බව දන්වමි. |

3.5 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු වාහන 02 ක ලියාපදිංචි පොත් අස්ථාන ගතවී තිබුණු අතර අවසන් වරට ආදායම් බලපත්‍රය ලබාගත් වර්ෂය සොයා ගැනීමට නොහැකි විය. | සභාව සතු වාහන වාර්ෂිකව ලියාපදිංචි කල යුතුය. | සභාව නමින් ලියාපදිංචි කිරීමට කටයුතු කරන බව දන්වමි. |